Article 12(2)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019 - 10 - 17

පැමිණිලි පාර්ශවය : පි. ඒ. පීරිස් මහතා,
අංක 137/ඒ, කළුදැවල,
පානදුර.

වගඋත්තරකරුවන් : 01. විදුහල්පති,
රාජකීය විද්‍යාලය,
පානදුර.

02. බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
ග්‍රීන් පාත්, කොළඹ 07.

<u>පැමිණිලි අංකය</u> : **HRC/716/18**

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිලිකරු විසින් 2018-03-07 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ල ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා වන පි.ටි.ඒ. පීරිස් යන දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට අයදුම් කර සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 49ක් උපයාගත්තා ලද බවත්, පාසලට තෝරා ගන්නා අවම ලකුණු සීමාව ලකුණු 50 ක් වන බවත්ය. පාසල් 08ක් සඳහා පාසල විසින් තම ලකුණු අඩු කළ නමුත් තමාට පාසල් 08කට නොව පාසල් 07කට පමණක් ලකුණු අඩු විය යුතු බව පැමිණිලිකරු විසින් දන්වා ඇත. පානදුර සිරිල් ජයස් මහා විද්‍යාලයට අදාළ ලකුණු 05 තමාට හිමි විය යුතු අතර, එම ලකුණු 05 තමා උපයාගත් මුළු ලකුණු ප්‍රමාණය වන ලකුණු 49ට එකතු වූයේ නම් සියලුම ලේඛන සඳහා ලබා දිය යුතු මුළු ලකුණු ප්‍රමාණය ලකුණු 54ක් වන බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉවත් කරන ලද ලකුණු 05 අභියාචනා මණ්ඩලය විසින් ලබා දී තිබූ නමුත්, මාගේ දරුවා ඉහත කී වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් කර නොගත් බවත් ඒ අනුව



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තම දරුවා පාසලට ඇතුළත් කර දෙන ලෙසත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙන් අයැද සිටියි.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, මෙම පැමිණිලිකරු ආසන්නතා පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 49ක් උපයාගෙන ඇති බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුට පාසල් 08ට ලකුණු අඩු කර ඇති අතර, එහිදී පානදුර සිරිල් ජයල් විද්‍යාලයට ලකුණු අඩු කර ඇති බවත්ය. එහෙත් අභියාචනා මණ්ඩලය විසින් එම ප්‍රදේශයේ ආසන්නතා ගණය යටතේ අයදුම් පත්‍ර ඉදිරිපත් කළ අනිත් සියලු දෙනාට පානදුර සිරිල් ජයස් විද්‍යාලයට ලකුණු 05 ලබා දී ඇති බව පැමිණි වගඋත්තරකරු කොමිෂන් සභාවේදී පිළිගෙන ඇත. ඒ අනුව එම විද්‍යාලයට අඩු කළ ලකුණු 05 පැමිණිලිකරු වෙත හිමි විය යුතු බව වගඋත්තර පාර්ශවය කොමිෂන් සභාවට දන්වා ඇත.

මෙකී තත්ත්වය මත පාසලට ළමුන් ඇතුළත් කිරීමට විදුහල්පතිවරයාට හැකියාවක් නොමැති බවත්, බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්වරයාගේ අනුමැතිය ලැබෙන්නේ නම් පාසලට දරුවා ඇතුළත් කර ගත හැකි බව 01 වන වගඋත්තරකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට දන්වා ඇත.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු –:

දෙපාර්ශවය විසින්ම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ලිඛිත හා වාචික කරුණු ඉදිරිපත් කර ඇති අතර, එම කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත කරුණු අනාවරණය වී ඇත.

පැමිණිලිකරු ඒ 157 ආසන්නතා පදනම යටතේ සම්මුඛ පරීක්ෂණයට සහභාගි වී ලකුණු 49ක් උපයාගෙන ඇති අතර, පැමිණිලිකරුට පාසල් 08කට ලකුණු අඩු කර ඇති බවත්, එම ප්‍රදේශයේ ආසන්නතා ගණය යටතේ ඉල්ලුම් කල අනෙකුත් අයදුම්කරුවන්ට පානදුර සිරිල් ජයල් විද්‍යාලයට ලකුණු 05ක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම පැමිණිලිකරුටද මෙම ලකුණු 05 හිමි විය බවත්, ඒ අනුව පැමිණිලිකරුගේ ලකුණු මට්ටම 54 දක්වා වැඩි වෙන බව ඉදිරිපත් කරන ලද කරුණු අනුව පැහැදිලි වේ.

පැමිණිලිකරුගේ ලබා ගත් ලකුණු ප්‍රමාණයට අමතරව තවත් ලකුණු 05ක් පානදුර සිරිල් ජයස් විද්‍යාලයට ලැබිය යුතු බව වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ පිළිගෙන ඇත. වර්තමාන තත්ත්වය අනුව සමථයක් ප්‍රකාරව පාසලට දරුවන් ඇතුලත් කිරිමට හැකියාවක් විද්‍යුහල්පතිට නොමැති බවත්, පළාත් අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලැබෙන්නේ නම් පාසලට දරුවා ඇතුලත් කර ගැනිමට පැමිණි වගඋත්තරකරු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ 2018-08-03 දාතම පරික්ෂණයේදී පිළිගෙන ඇත.

ඉහත කරුණු සියල්ල සලකා බැලිමේදි පෙනි යන්නේ අභියාචනා මණ්ඩල චක්‍රලේඛ අනුව කටයුතු කර ඇති බවත්, සම්මුඛ පරිකෂණ මණ්ඩලය චක්‍රලේඛය අභිබවා කටයුතු කර ඇති බවත්ය, එකී වැරදි සහගත ක්‍රියාවලිය තුලින් සිදු වී ඇති නිවැරදි නොවන ලකුණු අඩු කිරිමක් හේතු කොට ගෙන වගඋත්තරකාර පාර්ශවය අත්තනෝමතිකව ක්‍රියා කර ඇති බවට කරුණු අනාවරණය වේ. සම්මුඛ පරිකෂණ මණ්ලඩය එකී ප්‍රශ්නගත ලකුණු අඩු කිරිම තුලින් පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුලත් විමට තිබූ අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව හමුවේ කරන ලද පරික්ෂණය අනුව පැහැදිලි වේ. .

නිරීක්ෂණය :-

ඒ අනුව පාර්ශවයන් ඉදිරිපත් කර ඇති සියළුම ලිපිලේඛන සහ වාචික කරුණු සලකා බැලිමෙන් පසු එකී සමස්ථ කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 12 (1) ව්‍යවස්ථවෙ මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් වගඋත්තරකරුවන් ක්‍රියා කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකරුගේ දරුවා වන පි.ටි.ජ්. පීරිස් දරුවා වගඋත්තරකාර විද්‍යාලයේ 2019 වර්ෂයේ දෙවන ශ්‍රේණියට ඇතුලත් කර ගැනිමට කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

මෙම නිර්දේශය අනුව කටයුතු කර 2019-11-29 වන දිනට පෙර වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වා සිටිමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

රමණි මුත්තෙට්ටුවේගම.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. ගරු අමාත්‍යතුමා.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

02 ලේකම්.
අධ්‍යාපන අමාත්‍යාංශය.
ඉසුරුපාය. බත්තරමු

B/R=7